**ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව - 2017**

---------------------------------------------------

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2016 අංක 11 දරන ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පනතේ 19 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති වෙනුවෙන් අත්පත් කරගත් එහෙත් මුදල් ගෙවා නොතිබූ රු. 2,448,971 ක් වූ උපකරණ 3 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුනු අතර සමාලෝචිත වර්ෂයේදී මුදල් ගෙවන ලද එහෙත් අත්පත් කර නොගත් රු. 2,521,362ක් ක් වූ උපකරණ 05 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු.136,000 ක් වූ අගරු චෙක්පත් 45 ක් අදාල වියදම් ගිණුමට බැර කර තිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

--------------------------------------------------------------------------

2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අත්තිකාරම් ලබාගන්නා ලද කාර්යය නිමවූ විගස පියවීමට කටයුතු කල යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 07 කදී ලබාගන්නා ලද එකතුව රු. 581,000 ක් වූ අත්තිකාරම් පියවීම සඳහා දින 20 සිට දින 287 දක්වා කාලයක් ගතවී තිබුණි. එමෙන්ම, 2015 හා 2016 වර්ෂවලදී පර්යේෂණ ව්‍යාපෘති 6 ක් සඳහා ලබා දී තිබූ රු.125,578 ක අග්‍රිම 2017 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,084,732 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.571,740 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.512,992 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සැපයුම් හා පරිභෝජන වියදම් රු. 3,487,406කින් වැඩිවුවද, පුනරාවර්තන ප්‍රදාන ලැබීම් රු. 4,302,111කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සභාවේ මූල්‍ය ප්‍රතිඵලයේ 2013 වර්ෂයේදී ඌනතාවයක් දක්නට ලැබුනද, 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම මූල්‍ය ප්‍රතිඵලය අතිරික්තයක් පෙන්නුම් කර තිබුණි. එහෙත් සේවක

පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමෙන් පසු 2013 වර්ෂයේදී රු.33,450,089ක් වූ දායකත්වය 2017 වර්ෂය වන විට රු.56,780,182ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

පර්යේෂණ සභාව විසින් ප්‍රධාන වශයෙන් තනි පුද්ගල පර්යේෂණ ව්‍යාපෘති, අරමුණුගත බහු විෂයික පර්යේෂණ ව්‍යාපෘති සහ පෞද්ගලික රාජ්‍ය හවුල්කාරීත්ව පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කළද, සමාලෝචිත වර්ෂය සඳහා සකස්කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් පර්යේෂණ ව්‍යාපෘති සඳහා වෙන්කළ ප්‍රතිපාදන වෙන් වෙන් වශයෙන් දක්වා නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික පර්යේෂණ සභාව පනතේ 03 (ආ) වගන්තිය ප්‍රකාරව ජාතික අවශ්‍යතාවලට දායක වන පර්යේෂණ පදනමක් සංවර්ධනය කිරීම සඳහා පහසුකම් සැලසීම පර්යේෂණ සභාවේ කාර්ය භාරයක් වුවද "පර්යේෂක මූලික පර්යේෂණ" ව්‍යාපෘතිවල අවසන් ප්‍රතිඵලය ඇගයීමේ දී එහි සාර්ථකත්වය තීරණය කරනු ලබන නිර්ණායකය ලෙස Science Citation Index(SCI) හි ප්‍රකාශනයක් සිදු කිරීමේ හැකියාව සැලකිල්ලට ගන්නා අතර පර්යේෂණයෙහි ප්‍රතිඵලය, එහි බලපෑම හා ප්‍රායෝගික භාවිතය පිළිබඳ අවධානය යොමු කර ඒ පිළිබඳ මතයක් හෝ නිර්දේශයක් ලබා දීමක් පර්යේෂණ සභාව විසින් සිදු කරනු නොලබයි.

(ආ) 2016 හා 2017 වර්ෂවලදී රු.171,915,712 ක ප්‍රදාන වටිනාකමකින් යුත් "පර්යේෂක මූලික පර්යේෂණ" ව්‍යාපෘති 45ක අවසන් වාර්තා ඇගයීම් සිදුකර තිබුණු අතර ඉන් රු.88,386,921ක ප්‍රදාන වටිනාකමකින් යුත් පර්යේෂණ ව්‍යාපෘති 21 ක ඇගයීම් වාර්තා අනුව ව්‍යාපෘති සාර්ථක ලෙස අවසන් කර ඇති බව සඳහන් කර තිබුණි. එහෙත් එම ව්‍යාපෘතිවල ප්‍රතිඵලයන් ජාතික අවශ්‍යතාවයන්ට යොදා ගැනීමේ හැකියාව පිළිබඳ ඇගයීමක් සිදු කර පර්යේෂණය වැඩි දියුණු කර භාණ්ඩයක් හෝ ක්‍රියාවලියක් වැඩිදියුණු කිරීම පිළිබඳ විනිශ්චයක් ලබා දී නොතිබුණි. එමෙන්ම මෙම පර්යේෂණ ව්‍යාපෘතිවලින් පේටන්ට් බලපත්‍ර ලබාගෙන තිබුණේ ප්‍රදාන වටිනාකම රු.5,323,000 ක් වූ එක් පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා පමණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට කෙරීගෙන යන පර්යේෂණ ව්‍යාපෘති අතරින් 2014 හා 2015 හා 2016 වර්ෂවලදී රු. 110,233,227ක ප්‍රතිපාදන ලබා දෙන ලද පර්යේෂණ ව්‍යාපෘති 32ක මූල්‍ය ප්‍රගතිය සියයට 7 ත් සියයට 50 ත් අතර බව නිරීක්ෂණය විය.

(ඈ) පර්යේෂණ ව්‍යාපෘති සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ පොදු නීතිරීති හා රෙගුලාසි අංක 21 අනුව ව්‍යාපෘති අවසන් වී මාස 03 ක් ඇතුළත අවසන් වාර්තාව ඉදිරිපත් කළ යුතු වුවද 2016 සහ 2017 වර්ෂවලදී අවසන් කරන ලද ප්‍රදාන වටිනාකම රු29,419,455ක් වූ පර්යේෂණ ව්‍යාපෘති 11කට අදාල පර්යේෂණ වාර්තා 2018 ජූලි විගණන දින වන විටත් ලැබී නොතිබුණි. එහි ප්‍රමාද කාලය මාස 03 සිට මාස 19 අතර විය.

(ඉ) 2012 අගෝස්තු 31 දින ආරම්භ කර 2015 අගෝස්තු 30 දින අවසන් කරන ලද රු. 2,635,000 ක ප්‍රදාන වටිනාකමකින් යුත් පර්යේෂණ ව්‍යාපෘතියක අවසන් වාර්තාවට අදාල ඇගයීම් වාර්තා 2017 පෙබරවාරි 25 දින ලබාදී තිබුණි. ඇගයීම් වාර්තාවට අනුව පර්යේෂණය ''සතුටුදායකයි'' යන්න සඳහන් කර තිබුණි. එහෙත් ව්‍යාපෘතිය අවසන් වී වර්ෂ 2කට වැඩිකාලයක් ගත වී තිබුණද ව්‍යාපෘති යෝජනාවෙහි සඳහන් අපේක්ෂිත අරමුණු 5 අතරින් අරමුණු 3ක් ඉටුකර ගැනීමට අසමත් වී තිබුණි.

(ඊ) වල්ලාපට්ට ශාක විශේෂයන්හි ස්‍රාවය වාණිජකරණය කිරීම සඳහා සුදුසු ලෙස වැඩිදියුණු කිරීම සහ පැල තවාන් ස්ථාපිත කිරීම සඳහා පුද්ගලික සමාගමක් සමඟ 2013 වර්ෂයේදී ආරම්භ කරන ලද පිරිවැය රු. 11,583,792 ක් වූ පර්යේෂණ ව්‍යාපෘතිය 2017 දෙසැම්බර් වන විට සාර්ථක ලෙස අවසන් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් පර්යේෂණ සභාව රු. 5,687,500 ක් වැයකර තිබුණි. මේ තුලින් ඍජු හා වක්‍ර රැකියා අවස්ථා ඇති කිරීමත්, අපනයනය තුලින් ආදායමක් ලබා ගැනීමත් අපේක්ෂා කලද 2018 ජූලි විගණන දින වන විටත් වල්ලාපට්ට ශාකයේ කොටස් අපනයනය කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලබාගැනීමට අපොහොසත් වී තිබුණි. එබැවින් ව්‍යාපෘතියෙහි අපේක්ෂිත අරමුණු කරා ලගා වීමට නොහැකි වී තිබුණි.

(උ) වව්නියාව දිස්ත්‍රික්කයේ තෝරාගත් ග්‍රාම නිලධාරී කොට්ඨාශයක් තුල පානීය ජලය හා ගෘහාශ්‍රිත ජලය තුල ෆ්ලොරයිඩ් මට්ටම හා සාන්ද්‍රත්වය අඩුකිරීම තුලින් වකුගඩු ආසාදනය අවමකිරීම සඳහා වන බලපෑම හඳුනාගැනීම සඳහා පර්යේෂණ සභාව පුද්ගලික සමාගමක් සමග එක්ව 2014 වර්ෂයේදී ඇස්තමේන්තුගත පිරිවැය රු. 20,218,000 ක් වූ පර්යේෂණ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘති යෝජනාවේ ප්‍රධාන අරමුණු ලෙස, ජල පිරිපහදු උපකරණයක් විද්‍යාත්මකව ස්ථානගත කිරීම සහ අවම ෆ්ලෝරයිඩ් මට්ටමකින් හා ඝනත්වයකින් යුතු ජලය සමස්ථ ග්‍රාම නිලධාරී කොට්ඨාසයට සැපයීම තුලින් වකුගඩු ආසාදිත තත්ත්වයන් වලක්වාගැනීම හා අවමකර ගැනීමේ හැකියාව විද්‍යාත්මකව පරික්ෂා කිරීම අන්තර්ගත වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමස්ථ ව්‍යාපෘතිය සඳහා පර්යේෂණ සභාවේ දායකත්වය වන රු. 10,109,000ක මුදලින් සියයට 24 ක් එනම් රු 2,403,925 ක් වැයකර ජල පිරිපහදු උපකරණයක් 2014 අගෝස්තු මාසයේදී මිල දී ගෙන තිබුණද උපකරණය මිලදී ගැනීමට පෙර, උපකරණය ස්ථානගත කිරීම සඳහා ස්ථානයක් විධිමත් පරිදි හඳුනාගෙන නොතිබුණි. පෞද්ගලික ඉඩම් හිමියෙකුගේ ඉඩමක 2014 අගෝස්තු මාසයේ දී එය ස්ථානගත කලද ඉඩම් හිමිකරු සිය ඉඩම ඉල්ලා තිබීම නිසා පිරිපහදු යන්ත්‍රය එම ස්ථානයෙන් 2015 මැයි මාසයේ දී ඉවත්කර තිබුණි. ඒ හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු නොකඩවා පවත්වාගෙන යාම සඳහා විකල්ප ස්ථානවලින් පිරිපහදු කරන ලද ජලය ලබාගෙන තිබුණි.

(ii) මෙම උපකරණය රු. 300,000කට තක්සේරුකර 2018 මාර්තු මාසයේදී රු. 78,000කට විකුණා තිබුණි. ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ව්‍යාපෘතිය ආරම්භ නොකිරීම හේතුවෙන් උපකරණය මිලදී ගැනීම ආර්ථික නොවන ගනුදෙනුවක් ලෙස නිරීක්ෂණය විය. තවද, ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණක් වූ ජල පිරිපහදු උපකරණයක් ස්ථානගත කිරීම ද ඉටුකර ගත හැකිවී නොතිබුණි.

(iii) ව්‍යාපෘති ගිවිසුම අනුව ව්‍යාපෘති කාලය 2017 අගෝස්තු 11 දිනයේ අවසන් වී තිබුනු අතර මාස 03 ක් ඉකුත් වීමට පෙර ව්‍යාපෘතිය පිළිබඳ විශ්ලේෂණ වාර්තාවක් පර්යේෂණ සභාව වෙත ලබාදිය යුතු වුවත් 2018 ජූලි විගණන දින වන විටත් අවසන් ව්‍යාපෘති වාර්තාව සභාව වෙත ලබාදී නොතිබුණි.

**4.2** **කළමනාකරණ ක්‍රියාකාරකම්**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පර්යේෂණ සභාව විසින් පර්යේෂණ ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලබාදීමේදී, පර්යේෂණවල ප්‍රගතිය පිළිබඳ පරීක්ෂාකර වරින් වර ප්‍රතිපාදන ලබාදීම වෙනුවට පර්යේෂණය ආරම්භ කරන අවස්ථාවේදීම පර්යේෂණයට අදාල සම්පූර්ණ ප්‍රතිපාදනය ඒ ඒ ව්‍යාපෘති යටතේ වූ ජංගම ගිණුමකට බැර කරනු ලබයි. 2013 සිට 2017 දක්වා කාලපරිච්ඡේදය තුළදී ආරම්භ කරන ලද ව්‍යාපෘති 155කට අදාළව එලෙස ජංගම ගිණුම්වලට බැර කරන ලද රු.897,277,751ක ප්‍රදානවලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 522,205,060ක් ජංගම ගිණුම්වල නිෂ්කාර්යව පැවතුණි.

(ආ) 2008 සිට 2017 කාලපරිඡේදය තුලදී අවසන් කරන ලද ප්‍රදාන වටිනාකම රු. 223,136,633ක් වූ පර්යේෂණ ව්‍යාපෘති 55ක අවසන් වාර්තා ලබා දී 2018 ජූලි විගණන දින වන විට මාස 42ත් මාස 06ත් අතර කාලයක් ගත වී තිබුණද පර්යේෂණ ව්‍යාපෘතිවල ඇගයීම් කටයුතු සිදු කර නොතිබුණි. මෙලෙස ඇගයීම් කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් පර්යේෂණ ප්‍රතිඵලයන්හි ප්‍රායෝගික වැදගත්කම අවම විය හැකි වේ.

## 5. තිරසර සංවර්ධනය

---------------------

### 5.1 තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළගා කර ගැනීම

---------------------------------------------------------------

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික පර්යේෂණ සභාව විසින් සිය විෂය පථයට අනුව ළගා කර ගත යුතු අරමුණු ලෙස තිරසර කෘෂිකර්මාන්තයක් ප්‍රවර්ධනය කිරීම, සෑම වයසකදිම සෞඛ්‍ය සම්පන්න හා හොඳ ජීවිතයක් ප්‍රවර්ධනය කිරීම, තිරසාර කර්මාන්තකරණයක් ප්‍රවර්ධනය කිරීම, තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය තහවුරු කිරීම සහ සමුද්‍රීය සම්පත් තිරසර පරිහරණය යන අරමුණු හඳුනාගෙන තිබුණි.

එම අරමුණු අතරින් තිරසාර කර්මාන්තකරණයක් ප්‍රවර්ධනය කිරීම යන අරමුණ පර්යේෂණ සභාවේ විෂය පථයට ඍජුවම අදාල වන බැවින් ඒ යටතේ ප්‍රධාන ඉලක්කය ලෙස නවෝත්පාදන දිරිගැන්වීම සහ පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්හි නියුතු සංඛ්‍යාව ඉහල නැංවීම සහ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පර්යේෂණ හා සංවර්ධනය සඳහා වූ වියදම් වැඩි කිරීමත්, එම ඉලක්ක මත ළගාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ලෙස ජනගහනයේ මිලියනයක් සඳහා සිටින පර්යේෂකයන් සංඛ්‍යාව, රාජ්‍ය පෞද්ගලික හවුල්කාර පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රතිශතය, වාර්ෂිකව බිහිවන නවෝත්පාදන සංඛ්‍යාව සහ වාණිජකරණය වූ සංඛ්‍යාව, ලබාගෙන ඇති පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව, සිදුකරන ලද ජාතික හා අන්තර්ජාතික ප්‍රකාශන සංඛ්‍යාව හා පර්යේෂණ තුලින් පිළියම් යොදන ලද ජාතික වශයෙන් පැනනැගී ඇති ගැටලු ප්‍රමාණය ආදිය හඳුනාගත හැකි වුවත් එසේ හඳුනාගෙන නොතිබුණි.

(ආ) පර්යේෂණ සභාව විසින් තම විෂය පථයට අදාලව අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණද, ඊට අදාල දර්ශක පැහැදිලිව හඳුනාගෙන නොතිබුණි. "තිරසාර කර්මාන්තකරණයක් ප්‍රවර්ධනය කිරීම" අරමුණකට අදාලව හඳුනාගෙන තිබූ දර්ශකය වූයේ එක් එක් ක්ෂේත්‍රවලින් ලබා දෙනු ලබන ප්‍රදානවල වටිනාකම හෝ ප්‍රතිශතයයි. අරමුණුවලට ලගාවීමේ ප්‍රගතිය මැන බැලීමේ අවසාන දර්ශකය ලෙස එය නිවැරදි වුවද ජාතික අවශ්‍යතාවයන්ට අදාලව රජයේ ප්‍රදාන ප්‍රශස්ථ භාවිතය තහවුරු කිරීමේදී හඳුනාගත් අංශවල වර්තමානයේ පවත්නා ගැටලු මොනවාද, ඉන් ප්‍රමුඛ විසඳුම් අවශ්‍යවන ගැටලු මොනවාද යන්න නිවැරදිව නිර්ණය කිරීම. ඒ සඳහා එක් එක්

ක්ෂේත්‍රවලට අදාල වැදගත් දර්ශක සෞඛ්‍ය අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව වැනි ආයතන සමඟ සහයෝගීත්වයෙන් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ජාතික අවශ්‍යතාවලට දායක වන පර්යේෂණ පදනමක් සංවර්ධනය කිරීම පර්යේෂණ සභාවේ ප්‍රධාන අරමුණක් වන බැවින් ඉහත සඳහන් තිරසර සංවර්ධන අරමුණුවලට අමතරව "සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම" යන්න සඳහා වක්‍රව දායකවීමේ හැකියාව හඳුනා ගෙන නොතිබුණි. එසේ හෙයින් ඒ හා සම්බන්ධවන ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ළඟා විය යුතු සංධිස්ථානයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා(දර්ශක මත පදනම්ව) නිවැරදි දත්ත පදනමක් පැවැතීම අත්‍යාවශ්‍ය වුවත්, සභාව විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකිරීම වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර ගැනීම, පුහුණු සේවකයකු නිර්ණය කිරීම හා භෞතික පහසුකම් ප්‍රමාණවත් පරිදි සපුරා ගැනීම යන කරුණු කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------------

### 6.1 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පර්යේෂණ ව්‍යාපෘති කාර්යක්ෂමව හා අපේක්ෂිත කාලපරිඡේදය තුල අවසන් කිරීම තහවුරු කිරීම සඳහා උපකරණ මිලදී ගැනීම් ප්‍රමාදයකින් තොරව සිදු කිරීම සඳහා සැලැස්මක් සකස්කර තිබිය යුතු බැවින් පර්යේෂණ ව්‍යාපෘති යෝජනා ලබා ගන්නා අවස්ථාවේදී, ප්‍රසම්පාදන වර්ගය, ප්‍රසම්පාදන ක්‍රමය, ලංසු ලේඛන සකස් කිරීම සහ අනුමැතිය සඳහා ගත වන කාලය, මිල ගණන් කැඳවීම සඳහා ගත වන කාලය, තාක්ෂණික කමිටු ඇගයීම්, ප්‍රසම්පාදන කමිටු අනුමැතිය සඳහා අවශ්‍ය කාලය ආදී ප්‍රසම්පාදන ක්‍රියාවලියක මූලික අංගයන් ඇතුළත් කර ප්‍රසම්පාදන සැලැස්මක්/කාල රාමුවක් පර්යේෂකගෙන් ලබාගත යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී පර්යේෂණ ව්‍යාපෘති 52 ක් සඳහා රු. 73,461,671ක් වූ උපකරණ මිලදී ගෙන තිබුණු අතර එම මිලදී ගැනීම් සඳහා ප්‍රදාන ලබා දීම 2014 සිට 2016 දක්වා කාලපරිච්ඡේදය තුලදී සිදු කර තිබුණු බැවින් ප්‍රසම්පාදනය මනාව සැලසුම් කළේ නම් ප්‍රමාදයකින් තොරව මිලදී ගැනීමේ හැකියාව පැවති බව නිරීක්ෂණය විය.

## 7. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) පර්යේෂණ ව්‍යාපෘති කළමනාකරණය | (i) ප්‍රගති වාර්තා නිසි වේලාවට ලබා නොගැනීම හා ඇගයීම් කටයුතු සිදු කිරීමට දීර්ඝ කාලයක් ගත වීම. |

| | | |
|---|---|---|
| | | (ii) ප්‍රගති වාර්තාවලට අදාල ඇගයීම් කරුවන්ගේ අදහස් දැක්වීම් පිළිබඳ පර්යේෂක දැනුවත් කල ද ඒ සම්බන්ධ ප්‍රතිචාර වහාම ලබා ගැනීමේ ක්‍රමවේදයක් නොතිබීම. |
| | | (iii) පර්යේෂක නියෝජනය කරන පර්යේෂණ ආයතනය, ව්‍යාපෘතියේ ඇගයීම් සඳහා සම්බන්ධ නොවීම. |
| | | (iv) "පර්යේෂක මූලික පර්යේෂණ" ව්‍යාපෘතිවල ප්‍රගතිය ඇගයීමේ දී පර්යේෂක ලබා දෙන ප්‍රගති වාර්තා පමණක් ඇගයීමට ලක් කරන අතර භෞතිකව පරීක්ෂා කර ප්‍රගතිය සමාලෝචනය නොකිරීම. |
| | | (v) අරමුදල් ලබා දුන් වහාම පර්යේෂණය ආරම්භ කල බව තහවුරු කර ගැනීම සඳහා ක්‍රමවේදයක් නොවීම. |
| | | (vi) පර්යේෂණය හෝ පර්යේෂක සම්බන්ධයෙන් ඇගයීම්කරුවන්ට පුද්ගලික බැඳියාවක් නොමැති බවට වන ප්‍රකාශයක් ලබා නොගැනීම. |
| (ආ) | ප්‍රසම්පාදන කළමනාකරණය | (i) ප්‍රසම්පාදන කමිටුවල සහ තාක්ෂණික ඇගයීම් කමිටුවල සාමාජිකයින් විසින් රහස්‍යභාවය, අපක්ෂපාතීභාවය හා පෞද්ගලික බැඳියාවන් නොමැති බව පිළිබඳ ප්‍රකාශනයක් සිදු කර නොතිබීම. |
| | | (ii) ලංසු විවෘත කිරීමේදී ලංසුකරුවන් වෙනුවෙන් පැමිණීමේ ලේඛන නඩත්තු නොකිරීම. |
| (ඇ) | ස්ථාවර වත්කම් පාලනය | (i) ස්ථාවර වත්කම් මිලදී ගැනීම්වලට අදාලව භාණ්ඩ ලැබීම් පත්‍ර නිකුත් නොකිරීම. |
| | | (ii) මිලදී ගත් වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයෙහි සටහන් කිරීමේදී ප්‍රමාදයන් පැවතීම සහ ඇතැම් වත්කම් සටහන් කිරීම මග හැරීම, අවශ්‍ය සියලු තොරතුරු ඇතුලත් නොකිරීම. |
| | | (iii) ස්ථාවර වත්කම් ලේඛනය සහ ලෙජර් ගිණුම්වල සටහන් සැසඳීම් සිදු නොකිරීම හා අධීක්ෂණ නිලධාරියෙකු විසින් අධීක්ෂණය නොකිරීම. |
| (ඇ) | සුළු මුදල් වියදම් පාලනය | සුළු මුදල් වියදම් ලේඛන බලයලත් නිලධාරියෙකු විසින් අනුමත කර නොතිබීම. |